1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ

පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බ

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමට අයත් ඉඩමක පදිංචි එක් අනවසර පදිංචිකරුවෙකුට එකඟතා ගිවිසුම අනුව ගෙවූ රු.6,000,000 ක වන්දි මුදල කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා ගිණුම්කරණ ප්‍රමිතයන්හි 17 පරිච්ඡේදයේ 17.10 වගන්තියට පටහැනිව ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉතිරි පදිංචිකරුවන් සඳහා එකඟතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ගෙවීමට ඉඩ ඇති රු.18,240,000 ක වටිනාකම සම්බන්ධව අසම්භාව්‍ය බැරකම් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා ගිණුම්කරණ ප්‍රමිතයන් හි 21 ඡේදයේ 21.12 හා 21.15 ප්‍රකාරව හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් ඉවත් කර ගැනීමට එකඟතාවයක් ඇති කර ගැනිම සඳහා මුදලක් යෝජනා (offer) වී ඇති බවත්, එය ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට ඇති බැදියාවක් (obligation)නොවන බව දන්වා ඇත.	**ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය.**

1.5.2 **ගිණුම්කරණ අඩුපාඩු**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී රු.5,823,260 ක් වූ සුභසාධන වියදම හා අනෙකුත් වෙන්කිරීම් සුභසාධන වියදම් ගිණුම බැර කර අනෙකුත් වෙන් කිරීම් ගිණුමට හර කර තිබීම නිසා, වියදම් හා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	2024 දෙසැම්බර් 18 වන දින සේවා ඇගයීම් සඳහා රන් පවුම් 5 ක් මිලදී ගනු ලැබුවත් ඒ සඳහා වන සේවා ඇගයීම් උත්සව නොපැවැත්වූ බැවින් එය වියදමක් ලෙස ගිණුම්ගත කළ නොහැකි බවත්, එම රන් පවුම් 5 ඉදිරි සේවා ඇගයීම් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන බැවින් ඒවා ආයතනයේ වත්කමක් ලෙස තොග ගිණුමකට හර කර ඇති බවත් දන්වා ඇත. පාසල් පොත් හා උපකරණ බෙදා දීම රු.3,580,036 සේවකයින්ගේ දරුවන්ගේ රු.1,005,587 සපත්තු හා තෑගි වවුචර් ත්‍යාග, ශිෂ්‍යත්ව, ක්‍රීඩා රු.150,838 රු.5,823,260 එකතුවන බව	වියදම් හා වෙන්කිරීම් නිවැරදිව ගිණුම් තැබිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.4,012,120 ක් වූ 2022 හා 2023 වර්ෂවල ණයගැති බැර වටිනාකම් හා වැඩිපුර ගෙවීම් නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් හා වෙනත් ගෙවිය යුතු දෑ එම වටිනාකමින් අඩුවී තිබුණි.	2022 හා 2023 වර්ෂවල ගණුදෙනුකරුවන් විසින් ඍජුවම බැංකු ගිණුමට තැම්පත් කර ඇති හඳුනාගත හැකි තැන්පතු නිසි ආකාරයෙන් හඳුනාගත් පසු තවදුරටත් හඳුනා ගැනිමට අපහසු තැම්පතු සහ 2022 වර්ෂයේ	ණයගැති බැර වටිනාකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.

	ණයගැතියන්ගෙන් ලද වැඩිපුර ලැබීම්, මෙලෙස 2024 වර්ෂයේ විවිධ ආදායම් ගිණුමට බැර කිරිමට කටයුතු කර ඇති බව.	
(ඇ) 2023 වර්ෂයට අදාළ රු.1,967,962 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණු අතර ලැබිය යුතු පොලී ආදායම රු.1,309,283 ක් වැඩියෙන් දක්වා තිබුණි.	රු.1,309,282 එකඟවන බව	කාලපරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ) ඉකුත් වර්ෂයේ රු.136,536 ක කොමිස් වියදම් හා රු.439,860 ක වරිපනම් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.576,396 ක් වැඩියෙන් දැක්වීම නිසා ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	එකඟවන බව.	සමාලෝචිත වර්ෂයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ) සමාලෝචිත වර්ෂයේ රු.340,000 ක නඩත්තු වියදම් හා රු.198,176 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු ඉකුත් වර්ෂයේ වියදම් වශයෙන් හඳුනාගෙන තිබීම හා පාරිතෝෂිත වෙන් කිරීම රු.146,662 කින් ඌන ගණනය වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.684,838 ක් අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	එකඟවන බව.	සමාලෝචිත වර්ෂයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ) සමාලෝචිත වර්ෂයේ ඩීසල් මිලදී ගැනීමේ පිරිවැය එකතු කළ අගය මත බදු සහිතව ගණනය කිරීම හේතුවෙන් රු.700,718 කින් වැඩියෙන් දක්වා තිබුණි.	එකඟ වන බව.	වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතේ 5 වන වගන්තිය සහ 1999 අප්‍රේල් 07 දිනැති අංක 1074/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සමාගමේ මූල්‍ය වාර්තාකරණ රාමුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත විය යුතු වුවත්, කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමාගම විසින් මූල්‍ය වාර්තාකරණ රාමුව වශයෙන් අනුගමනය කර තිබුණි.	කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 1 වන කොටස ප්‍රකාරව සමාගමේ මූල්‍ය වාර්තාකරණ රාමුව තීරණය කොට 2011 වර්ෂයේ සිට ගිණුම් පවත්වාගෙන ගොස් ඇති බව.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුය.

1.5.4 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ණයගැති වටිනාකම රු.761,200,999 ක් වූ අතර විගණනයට ලබාදුන් උපලේඛනයන් හි එකතු වටිනාකම රු.763,068,837 ක් වූයෙන් රු.1,867,838 ක වෙනසක් විය.	761,200,999	763,068,837	1,867,838	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ශේෂයන් සහ ඊට අදාළ ණයගැති උපලේඛනයෙහි ශේෂයන් අතර පවතින වෙනස සඳහා මාසිකව සහ වර්ෂ අවසානයේදී ශේෂ සැසඳුම් ප්‍රකාශයක් පිළියෙළ කරනු ලබන	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ණයගැතියන් ගේ ශේෂය හා උප ලේඛන වල එකතු වටිනාකම සැසඳිය යුතුය.

				බවත් එම වෙනස්කම් ඊට පසු මාසයන්හිදී අදාළ ශේෂ සමඟ ගැලපීම් කරනු ලබන බව.	
(ආ)සමාලෝචිත වර්ෂයේ පුවත්පත් දායකත්ව පදනම මත විකුණුම් ආදායම රු.20,929,229 ක් ලෙස දක්වා තිබූ අතර ගිණුම්කරණ පද්ධතිය තුල එම වටිනාකම රු.21,693,248 ක ශේෂයක් වූයෙන් රු.764,018 ක වෙනසක් විය.	20,929,229	21,693,248	764,018	ගිණුම්කරණ පද්ධතියේ ගිණුම් ගතවී තිබෙන දායකත්ව පදනම මත (Subscription) විකුණුම් ආදායම හා ඒ සම්බන්ධයෙන් වන මෙහෙයුම් පරිගණක පද්ධතියේ (Sp Solutions) අතර රු.764,018 ක වෙනසක් පෙන්වන අතර, එම වෙනසට හේතු සම්බන්ධයෙන් සැසඳුම් ප්‍රකාශකයක් පිළියෙළ කිරිමට කටයුතු කරනු ලබයි.	දායකත්ව පදනම මත පුවත්පත් විකුණුම් ආදායම හා මෙහෙයුම් පද්ධතියේ වටිනාකම අතර වෙනස්කම් හඳුනාගෙන සැසඳීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේදී බාහිර මුද්‍රණ කටයුතු වෙනුවෙන් සමාගමේ වාණිජ මුද්‍රණ අංශයට ලැබිය යුතු රු.25,814,282 ක් ද, පුවත්පත් අලෙවි නියෝජිතයන්ගෙන් ලැබිය යුතු රු.12,120,068 ක් හා නියෝජිතත්ත්වය අහෝසි කල පුවත්පත් නියෝජිතයන්ගෙන් ලැබිය යුතු රු.41,773,384 ක් ද, නීතිමය කටයුතු සඳහා යොමු කල ණයගැතියන්ගෙන් අය විය යුතු රු.75,849,393 ක් ද, සමාගම ග්‍රාහක පදනම මත ලබා දී තිබු පුවත්පත් හා වාර සඟරා සඳහා ලැබිය යුතු රු.14,244,992 ක් හා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට පුවත්පත් සැපයීම වෙනුවෙන් ලැබිය යුතු රු.2,209,560 ක් ද ලෙස, එකතුව රු.172,011,679 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට නොහැකිව තිබුණි.	ණය ශේෂයයන් අයකර ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	ලැබිය යුතු ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවකයන් විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා සමාගමෙන් ඉවත් වූ වර්ෂ 01 සිට 26 දක්වා අයකර නොගත් සේවකයන් 59 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.7,970,214 ක් වූ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වර්තමානයේ මෙවැනි හිඟ මුදල් අයකර ගැනිම සඳහා ආපදා ණය සඳහා ඇපකරුවන් තබා ගැනිම සහ ප්‍රවර්තන මාසයේ පැමිණිම සලකා බලා මාසික වේතන පිළියෙළ කිරිමේ ප්‍රවාහය නවතා දැමීම යන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර ඇති බව.	ලැබිය යුතු ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ) සමාලෝචිත වර්ෂයේ සනාතන ලිපි යැවූ රු.519,609,586 ක් වූ ණයගැතියන් 663 ක ශේෂයෙන් රු.456,168,104 ක ණයගැතියන් 606 දෙනෙකු ප්‍රතිචාර දක්වා නොතිබීම හේතුවෙන් සියයට 91 ක ණයගැති ශේෂ තහවුරු නොවීය. තවද, ප්‍රතිචාර ලද ණයගැතියන්ගෙන්	ශේෂ සනාථ කිරිම සඳහා යවන ලද ලිපි වලට සමහර ණයගැතියන් පිළිතුරු ලබා නොදුන්නද, 2025 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා කාලය තුල අදාල ණය මුදල් පියවීමේ කටයුතු සිදු කර ඇති බව දන්වා ඇත. 2024	ශේෂ සනාථන හා ගිණුම් ශේෂ සැසඳිය යුතුය. ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

රු.16,725,813 ක් වූ ණයගැතියන් 32 දෙදෙනෙකු පමණක් ණයගැති ශේෂ සමග එකඟ වී තිබුණු අතර එකඟ නොවූ ශේෂය රු.27,720,038 කි. එම එකඟ නොවූ ණයගැතියන් 25 දෙනාගෙන් 08 දෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින රු.4,063,390 චෙක්පත් මගින් ගෙවීම් කර තිබුණි .ඒ අනුව ප්‍රතිචාර ලද ණයගැතියන්ගෙන් සියයට 56 ප්‍රතිශතයකින් ණයගැති ශේෂ සමග එකඟ වූ අතර සියයට 44 ක ප්‍රතිශතයක් එකඟ නොවීය.	දෙසැම්බර් 31 දිනට සමාගමේ ගිණුම්වල දැක්වුණු ණයගැති ශේෂය සහ ණයගැතියන් විසින් තහවුරු කළ ශේෂය අතර පවතින වෙනස සඳහා මූලික හේතුව වන්නේ එදිනට මාර්ගස්ථව පැවති චෙක්පත් බවත් මෙම චෙක්පත් ආයතනය වෙත ලැබෙන තෙක් අදාළ ණයගැති ශේෂය පියවීමේ හැකියාව නොමැති බැවින්, චෙක්පත් ලැබුණු පසු පියවීම් සිදු කර ඇති බව.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය	මාසික ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් හෝ ලබා ගත නොහැකි වුවත්, සමාලෝචිත වර්ෂයේ වාහන දීමනාවට අමතරව රු.10,000 සිට රු.35,000 දක්වා රියදුරු දීමනා වශයෙන් රු.6,425,600 ක් ලබා දී තිබුණි.	සමාගම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කිරිම අවශ්‍ය නොවන බවත් සමාගමේ ප්‍රවාහන දීමනා ලබා දෙන ක්‍රමවේදයට අනුව අදාළ දීමනා ලබා දී ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (2) (ඒ) වගන්තිය	2019, 2020, 2021 හා 2022 වර්ෂ සඳහා එකතුව රු.76,810,224 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රමාද ගාස්තු සඳහා වූ අධිභාරය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවා නොතිබුණි.	කම්කරු දෙපාර්තමේන්තුව මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බවත් මේ සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලය අභියාචනාධිකරණයේ රිට් අයදුමක් (Write Application) ගොනු කිරීමට තීරණය කර ඇති බවත් දන්වා ඇත.	සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව කටයුතු කළ යුතුය.

1.8 **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාගම විසින් පාරිතෝෂික මුදල් ප්‍රමාණය රු.5,000,000 ඉක්මවන විට ගෙවිය යුතු මුළු පාරිතෝෂික මුදල් ප්‍රමාණය මත පදනම්ව (12%) රඳවා ගැනීම් සිදුකළ යුතු වුවත්, ආයතනය විසින් බදු චක්‍රය අනුව රු.358,360 ක් පමණක් රඳවාගත යුතු සේවකයෙකුගේ පාරිතෝෂික මුදලින් රු.958,360 ක් රඳවා ගැනීම නිසා රු.600,000 ක් අඩුවෙන් සේවකයාට ගෙවා තිබුණි.	අදාළ සේවකයා දැනුවත් කර ඇති බවත් දායකත්ව මුදල් ඇතුලත් ප්‍රකාශනය ලැබුණු පසු වැඩියෙන් රඳවාගත් මුදල අදාළ සේවකයාට නිදහස් කිරිමට කටයුතු කරනු ලබන බව.	**වැඩිපුර රඳවාගත් මුදල් සේවකයාට ගෙවීමට කටයුතු කළ යුතුය.**

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,785,000 ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.31,365,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,580,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් ඉකුත් වර්ෂයට සාපෙක්ෂව පුවත්පත් දැන්වීම් ආදායම සියයට 6 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කලද අනිකුත් ආදායම් සියයට 55 කින් හා වානිජ මුද්‍රණ ආදායම සියයට 41 කින් අඩු වීම හේතු වී තිබුණි.

2.2 අනුපාත විශ්ලේෂණය

අනුපාතය	**2024**	**2023**
ජංගම වත්කම් අනුපාතය (වාර ගණන)	**3.46**	**3.17**
ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන)	**2.60**	**2.54**
දල ලාභ අනුපාතය (%)	**58%**	**56%**
ශුද්ධ ලාභ අනුපාතය (%)	**1%**	**2%**
ණය ප්‍රාග්ධන අනුපාතය (වාර ගණන)	**0.82**	**0.87**

සමාලෝචිත වර්ෂයේ සමාගමේ දල ලාභ අනුපාතය සියයට 2 කින් පෙර වර්ෂය හා සැසඳීමේදී වැඩි වී තිබූ අතර ශුද්ධ ලාභ අනුපාතය සියයට 1 කින් අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2008 දෙසැම්බර් මස සමාගම විසින් ලංකා පුවත් ලිමිටඩ් හි කොටස් 1200ක් මිලදී ගැනීම සඳහා රු.1,200,000 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වෙතත් 2024 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.	ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ලංකා පුවත් සමාගම 2014 වසරේ සිට ක්‍රියාත්මක නොවන සමාගමක් බව.	ආයතනයේ අරමුණු වලට අනුකූලව ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජනයන් සිදු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)1985 වර්ෂයේ දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නිරත වීම සඳහා ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම ආරම්භ කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි.	ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම මෙහෙයුම් කටයුතු සිදුනොකරන සමාගමක් බව.	සමාගමේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කටයුතු සක්‍රීය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.
(ආ)ජනමාධ්‍ය අමාත්‍යාංශය සමග 2023 ජුනි 23 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ 3(i) වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සමාගමේ සේවයේ යෙදෙන සමස්ථ සේවක සංඛ්‍යාව 850 දක්වා අඩු කිරීම සමාගමේ අපේක්ෂාව ලෙස දක්වා තිබුණ ද සමාගමේ සමස්ථ සේවකයින් ගණන 889 ක් විය. ගිවිසුමේ 3(ii) වගන්තිය අනුව තනතුරුවලට බඳවා ගැනීමේ පටිපාටියක් සම්පාදනය කළ යුතු නමුත් 2025 මාර්තු 31 විගණිත දින	ජනමාධ්‍ය අමාත්‍යාංශය සමහ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 වන විට ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සමාගමේ සමස්ත සේවක සංඛ්‍යාව 850 දක්වා අඩු කිරීමට සමාගම අපේක්ෂා කර තිබූ බවත්, එම වකවානුව තුළ ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමේ ක්‍රමවේදය මගින් ආයතනය බලාපොරොත්තු වූ සේවක ප්‍රමාණයක් ඒ සඳහා යොමු නොවූ බැවින් එකී අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇති බව.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

විටත් බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අවසන් කර නොතිබුණි.		
(ඇ)2021 දෙසැම්බර් 21 දිනැති අංක අමප/21/2112/316/032-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආයතනවල සියලුම වෙළඳ දැන්වීම් සඳහා සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ දැන්වීම් පල කිරීම අනිවාර්යය කර ඇති පසුබිමක රජයේ දැන්වීම් ආදායම් ද ඇතුලත්ව දිරිදීමනා සඳහා ඉලක්ක ලබා දී තිබූ අතර වෙළඳ දැන්වීම් හා ගිණුම් (ආදායම්) යන අංශවල සේවකයන් සඳහා පමණක් 2024 වර්ෂයේදී රු.24,258,043 ක දිරිදීමනා ගෙවා තිබුණි.	අදාළ කැබිනට් අනුමැතිය අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල දැන්වීම් 100% ක්ම ලේක්හවුස් පුවත්පත්වල පළ කිරීමටත් අනෙකුත් වෙළඳ ප්‍රචාරණ දැන්වීම් පළකිරීමේදී මාධ්‍ය ප්‍රචාරණ ඇස්තමේන්තුවෙන් අවම 25% ක් වටිනා දැන්වීම් ලේක්හවුස්, ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත ලබාදීමටත් උපදෙස් ලබා දී ඇති බවත්. ඒ අනුව රාජ්‍ය ආයතනවල වෙළඳ ප්‍රචාරණ දැන්වීම් ලබා ගැනිම සඳහා ලේක්හවුස් දැන්වීම් කළමනාකරුවන් හා ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් දැඩි පරිශ්‍රමයක් දැරිය යුතු බවත්, මේ කරුණු සියල්ලම සැළකිල්ලට ගෙන දැන්වීම් දිරි දීමනා ලබා දීමේ ක්‍රමවේදය 2025 ජනවාරි මස සිට සංශෝධනය කිරීමට කටයුතු කර තිබෙන බව.	සේවකයන්ගේ අභිප්‍රේරණය වැඩිවන ආකාරයට දිරිදීමනා ලබාදීමේ ක්‍රමවේදය සකස් කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාගම විසින් පෞද්ගලික මාධ්‍ය ආයතනයක් සමග 2024 දෙසැම්බර් 10 දින ඇති කර ගෙන තිබුණු ප්‍රතිවෙළඳ ගිවිසුම අනුව ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු.165,720 ක දැන්වීම් පල කර තිබූ අතර ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව සමග 2023 වර්ෂයට අදාළව ඇතිකරගත් ප්‍රතිවෙළඳ ගිවිසුමේ වලංගු කාලය 2023 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වී තිබුණු අතර, එම ගිවිසුමේ වලංගු කාලය අවසන් වීමෙන් පසුව නව ගිවිසුමකට එළඹීමකින් තොරව දැන්වීම් පළ කර තිබුණි. පසුව සමාගම විසින් 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව සමාගම විසින් ගිවිසුමට එළඹ තිබුණේ මාස 05 කට පසු එනම් 2024 මැයි මස 30 වන දීය.	ඉදිරියේදී මෙම ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරනු ලබන බව.	ගිවිසුමට අනුකූල විය යුතු අතර වලංගු කාලය අවසන් වීමට පෙර නව ගිවිසුමකට එළඹිය යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරිම සඳහා 1985 වර්ෂයේදී මිලදී ගත් 2021 වර්ෂයේදී රු. රු.733,000,000 කට නැවත තක්සේරු කළ හෝකන්දර ප්‍රදේශයේ පිහිටි අක්කර 8 ක ඉඩම මිලදී ගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.	හෝකන්දර ප්‍රදේශයේ පිහිටි ඉඩම ඵලදායීව යොදා ගැනිම සඳහා විවිධ ආයෝජන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට සලකා බලමින් සිටින බව.	ආයතනයේ අරමුණුවලට අනුකූලව ඵලදායි ලෙස අයෝජනයන් සිදු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මුද්‍රණ කඩදාසි මෙ. ටො. 500 මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කැඳවීමකදී සැපයුම්කරුවන් 02 කුගෙන් මෙ.ටො. 400 බැගින් මෙ.ටො. 800 ක් සඳහා, ඩොලර් 575 ක් හා ඩොලර් 565 ක් වශයෙන් මිල ගණන් 02 කට අනුමැතිය ලබාදීමට කටයුතු කර තිබූ අතර අවම ලංසුකරුගෙන් කාර්ය සාධන ඇපකරයක් ලබා ගැනීම හෝ ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර නොතිබුණි.	මිල ගණන් කැඳවා තිබුණේ මෙ.ටො. 500 ක් සඳහා වුවත්, පැවති තොග තත්ත්වය, මුද්‍රණ කඩදාසි භාවිතය ඉහළ යාම හා මිළ ගණන් හොඳ තත්ත්වයේ තිබිම (පහළ මිල ගණන්) යන කරුණු සැළකිල්ලට ගෙන මෙ.ටො. 800 ක් ඇණවුම් කිරිමට ප්‍රසම්පාදන කමිටුව (Procurement Committee) තීරණය කර ඇති බව. ඇණවුම් කරන ලද ඇණවුමට අදාළව කාර්ය සාධන ඇපකරයක් ලබාදී නොතිබුණත්, මේ වන විට මුද්‍රණ කඩදාසි ඇණවුම් නියමිත කාර්ය සාධනය සපුරා ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 වසරේදී මානව සම්පත් උපදේශකවරියට රු.3,150,000 ක් ගෙවා සකස්කර ගන්නා ලද මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති	2016 අප්‍රේල් 25 දින සිට මානව සම්පත් උපදේශකවරියක් බඳවා ගෙන ඇති බවත්. ඇය වෙත නිකුත් කරන ලද යොමු කොන්දේසි (Terms of	බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය සකස් කිරීම කඩිනමින් සිදුකළ යුතුය.

07 ක් ප්‍රතිපත්ති 06 කට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාදී නොතිබුණු අතර, නැවත වරක් එම උපදේශකවරියම එම කාර්යයම සඳහාම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන 2022 නොවැම්බර් සිට 2023 ජුනි මස දක්වා රු.1,151,750 ක් උපදේශක ගාස්තුව ගෙවා තිබුණි. මෙකී මානව සම්පත් උපදේශකවරියගේ සේවය ලබා ගන්නා කාලය තුලම 2021 දෙසැම්බර් 23 දිනැති Chartered Institute of Personnel Management Sri Lanka සංශෝධිත යෝජනාවට අනුව 2022 මාර්තු 11 දින වන විට සමාගමේ බඳවා ගැනීමේ පටිපාටිය හා අනුමත කාර්යය මණ්ඩලය සම්පාදනය කර අවසන් කිරීමට සමාගම Chartered Institute of Personnel Management Sri Lanka සමග ගිවිසුම් ගත වී තිබුණු අතර එම කාර්යය සඳහා රු.1,300,000 ක පිරිවැයක් දැරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. එකඟ වූ පිරිවැයෙන් රු.1,137,500 ක් 2024 දෙසැම්බර් 31 දින විට අදාළ ආයතනය වෙත ගෙවා තිබුණ නමුත් ගිවිසුම් ගතවූ පරිදි සමාගමේ බඳවා ගැනීමේ පටිපාටිය හා අනුමත කාර්යය මණ්ඩලය පිළියෙල කිරීමේ කාර්යයභාර්ය 2024 දෙසැම්බර් 31 දින දක්වාත් අවසන් කර නොතිබුණි.

Reference) වලට අනුව මානව සම්පත් කළමණාකරණ ද හා සම්බන්ධ ප්‍රතිපත්ති පිළියෙළ කිරිම එයට අන්තර්ගත නොවන බවත්. ඇය විසින් මානව සම්පත් කළමනාකරණ සම්බන්ධ ප්‍රතිපත්ති 7 ක් පිළියෙළ කොට තිබෙන අතර, ඉන් එක් ප්‍රතිපත්තියක් අනුමත කොට ක්‍රියාත්මක කර ඇති බවත් දන්වා ඇත.

2022 නොවැම්බර් 08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇය නැවතත් මානව ප්‍රාග්ධන උපදේශකවරියක් ලෙස බඳවාගෙන ඇති බවත්, එහිදි ඇය වෙත නිකුත් කොට තිබෙන යොමු කොන්දේසි (Terms of Reference) වල බඳවා ගැනිමේ පටිපාටිය හා අනුමත කාර්ය මණ්ඩල සම්බන්ධ පැවරිමක් සිදුකොට නොමැති බවත්. Chartered Institute of Personnel Management of Sri Lanka ආයතනය මගින් සකසන ලද අනුමත කාර්ය මණ්ඩල සම්පාදනය පටිපාටිය ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන සේ සංශෝධනය කර ක්‍රියාත්මක කිරිමේ කටයුතු සිදුවෙමින් පවතින බව.